## බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## ජනාධිපති මාධ්‍ය සම්මාන උලෙළ - 2024

### ජනාධිපති මාධ්‍ය සම්මාන උලෙළේ ඉසව් කළමනාකරණ කටයුතු සඳහා ඉසව් කළමනාකරණ ආයතනයක් තෝරාගෙන කාර්යයේ යෙදවීම සඳහා වන ප්‍රසම්පාදනය

### අංක : MMM/NCB/2024-2

සභාපති, ප්‍රසම්පාදන කමිටුව - ජනමාධ්‍ය විසින්, ඉසව් කළමනාකරණ ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ආයතන වෙතින් පහත සඳහන් කොන්ත්‍රාත් සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ආරාධනා කෙරේ.

| කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත් නාමය හා ස්ථානය | ආපසු නොගෙවන ලේඛන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් |
|---|---|---|
| MMM/NCB/2024-2 | 2024 දෙසැම්බර් මස අරලියගහ මන්දිරයේ ප්‍රධාන ශාලාවේදී පැවැත්වීමට නියමිත ජනාධිපති මාධ්‍ය සම්මාන උලෙළ - 2024 හි ඉසව් කළමනාකරණ කටයුතු සඳහා ඉසව් කළමනාකරණ ආයතනයක් තෝරා ගැනීම | 2,000.00 |

2) විෂයපථය :

අ) වේදිකා නිර්මාණය, සැරසිලි, ආලෝකකරණය හා ඉලෙක්ට්‍රොනික කටයුතු.

ආ) උත්සව ශාලාවේ ඇතුළත හා පිටත සැරසිලි.

ඇ) සංස්කෘතික අංග (විනාඩි 5 බැගින් වූ අංග 3 - 4 ක්) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව හෝ වෙනත් ඕනෑම රජයේ ආයතනයක් හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක්.

ඈ) සම්මානලාභීන්ගේ වීඩියෝ දර්ශන සකස් කිරීම හා ප්‍රදර්ශනය. (නාමයෝජනා 50 ක් සඳහා රූපරාමු (Clips) / වීඩියෝ දර්ශන තත්පර 10 - 30 බැගින් වූ සහ ජීවිත කාලයට එක් වරක් පිදෙන සම්මාන 04 ක් සඳහා විනාඩි 2-3 බැගින් වූ වීඩියෝ දර්ශන).

ඉ) නිර්දේශිත නාම එළි දැක්වීමේ මාධ්‍ය හමුව.

ඊ) උලෙළ සජීවී ආවරණය, වීඩියෝ සහ ඡායාරූප (රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව / රාජ්‍ය මාධ්‍ය ආයතන සමග සම්බන්ධීකරණයෙන්)

3) මෙම ලංසුකරණය, තාක්ෂණ හා මූල්‍ය යෝජනා ඇතුළත් ද්විත්ව කවර ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් තත්ත්ව හා පිරිවැය තෝරාගැනීමේ ක්‍රමවේදය (QCBS) තුළින් පවත්වනු ලැබේ.

4) සුදුසුකම් නිර්ණායක :

ශ්‍රී ලංකාවේ ස්ථාපිත ඉසව් කළමනාකරණ ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් ආයතනවලට යෝජනා ඉදිරිපත් කළ හැක. අදාළ ආයතන, සතුව ඉසව් කළමනාකරණ ක්ෂේත්‍රයේ අවම වසර 7 ක පළපුරුද්ද තිබිය යුතුය.

5) උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් ඉසව් කළමනාකරණ ආයතනවලට අවශ්‍ය වැඩිදුර විස්තර, කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවත, "ඇසිදිසි මැඳුර", 163, ජනමාධ්‍ය අංශය, සංවර්ධන ශාඛාව වෙතින්, 2024-10-28 දින සිට 2024-11-19 දින දක්වා ඕනෑම කාර්යාල දිනයකදී (රජයේ නිවාඩු දින හා බැංකු නිවාඩු දින හැර) 09.00 පැය හා 15.00 පැය අතර කාලය තුළ, දුරකථන අංක 011-2513737 මගින් ලබාගත හැක.

6) උනන්දුවක් දක්වන ඉසව් කළමනාකරණ ආයතනවලට, 2024-11-19 දින දක්වා, කාර්යාල දිනවල, කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, "ඇසිදිසි මැඳුර", 163, ජනමාධ්‍ය අංශයේ ගිණුම් ශාඛාවෙන්, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ සම්පූර්ණ යෝජනා සඳහා ඉල්ලීම් (RFP) ලේඛන කට්ටලය ආපසු නොගෙවනු ලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් 2,000.00 ක් ගෙවීමෙන් ලබාගත හැක.

7) වෙන් වශයෙන් සකස් කළ තාක්ෂණ හා මූල්‍ය යෝජනා පහත සඳහන් ලිපිනය වෙත, අදාළ අවසන් දිනය වන 2024-11-20 දින 1400 පැයට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන යෝජනා ප්‍රතික්ෂේප කෙරේ. ලැබී ඇති තාක්ෂණ යෝජනා, අදාළ භාරගැනීමේ කාලය අවසන් වූ වහාම, කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, ඇසිදිසි මැඳුර, 163, ජනමාධ්‍ය අංශයේ ශ්‍රවණාගාරයේදී පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගේ ඉදිරියේ විවෘත කරනු ලැබේ.

8) මේ සම්බන්ධ පූර්ව - ලංසු රැස්වීම 2024-11-11 දින 1400 පැයට කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, ඇසිදිසි මැඳුර, 163, ජනමාධ්‍ය අංශයේ ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට නියමිතය.

9) මේ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

**සභාපති,**
**ප්‍රසම්පාදන කමිටුව - ජනමාධ්‍ය,**
**බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය**